**කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2019**

----------------------------------------------------------------

කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2014 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - III දරන ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංචලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය යකඩ පාලම් අංශය (Steel Bridge Section) සහ අමතර මාත්‍රා අංශය (Extra Dosed Section) ලෙස වෙන් කර ඇති අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 55,313 කට සමාන ජපන් යෙන් මිලියන 41,429 ක් වන අතර ඉන් රු.මිලියන 46,755 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 8,558 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය කාණ්ඩ දෙකෙහි වැඩ කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර පිළිවෙලින් 2021 මාර්තු 27 සහ 2021 මාර්තු 28 නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.1 ගිණුම්කරණ වෙනස්කම්.

පහත නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| ගිණුම්කරණ වෙනස්කම් | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ඡේද අංක 80 ට අනුව නිරවුල් කිරීම පිළිබඳ කාලය නොසලකා මුළු අන්තර් ගෙවීම වටිනාකම රු.මිලියන 2051.14 ක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණද, අන්තර් ගෙවීම් සහතික අංක 22 යටතේ රඳවා තබාගත් මුදල රු.මිලියන 66.60 ක් ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමාලෝචිත ගිණුම් වර්ෂයට අදාළව වෙන්ව පෙන්වා නොතිබුණි. | එක් එක් වගකීම් වෙන වෙනම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති වීම නිසා රු.මිලියන 66.60 කින් වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 22 දින අන්තර් ගෙවීම් සහතික වටිනාකම ඉංජිනේරු සහතික මත පදනම් විය. ඉංජිනේරු විසින් සහතික කරන ලද රු.මිලියන 658.04 ක වටිනාකම තුළ රු.මිලියන 66.60 ක් වූ රඳවාගැනීම ද ඇතුළත්ය. ඉංජිනේරු විසින් සහතික කිරීමෙන් පසුව ගෙවීමේ දී රඳවා තබාගත් මුදල් වගකීමක් ලෙස සැලකිය යුතුය. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර මෙම අන්තර් ගෙවීම සහතිකය ඉංජිනේරු විසින් සහතික කර තිබුණි. අපගේ 2019 දෙසැම්බර් අන්තර් ගෙවීම සහතික සඳහා වූ වෙන්කිරීම් පදනම මෙය වේ. | වර්ෂය අවසානයේ ඉංජිනේරු සහතික නොමැති වුවද වෘත්තීය විනිශ්චය පදනම් කරගෙන වෙන්කිරීම් සිදුකිරීමට. |

**2.2 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.**

| නීති රීති රෙගුලාසි වලට යොමුව. | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මාස 02 කට එක් වරක් රැස්වීම් පැවැත්විය යුතු වීම. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබීම. | ව්‍යාපෘති කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්කිරීම සඳහා වඩාත් අවධානය යොමු කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම සිදු කළ යුතු වූයෙන් මෙම කමිටු රැස්වීම් බොහෝ ගණනක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එම රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | කළමනාකරණ චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

**3. භෞතික කාර්යසාධනය.**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.**

| ව්‍යාපෘති කොටස් | ක්‍රියාකාරකම් | 2019 දෙසැම්බර් 31 දිනට -------------------- බලාපොරොත්තු වූ භෞතික කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස | ළඟා කරගත් කාර්යසාධනය ප්‍රතිශතයක් ලෙස | විගණන ගැටළුව | බලපෑම | ප්‍රමාද වීමට බලපෑ හේතු |
|---|---|---|---|---|---|---|
| ---------- | ----------- | ----------- | -------- | ------------ | ------------- | ------------------ |
| කාණ්ඩ I | යකඩ පාලම් කොටස | 68 | 56 | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ කාර්යසාධනය ළඟාකරගත නොහැකි වීම. බලාපොරොත්තු වූ කාර්ය සාධනය අතර සියයට 12 සිට සියයට 6 දක්වා වූ විචලනයන් පැවැත්ම. | කොන්ත්‍රාතුවේ සත්‍ය පිරිවැය ඉහළ යා හැකිය. | කොන්ත්‍රාත් ප්‍රදානයෙන් පසු රට තුළ පැවති කොන්ත්‍රාත්කරුට හෝ ආයතනයට පාලනය කරගත නොහැකි හේතු. |
| කාණ්ඩ II | අමතර මාත්‍රා කොටස | 62 | 56 | | | |

**කළමනාකරණ අදහස් දැක්වීම**

ඇති වූ සිද්ධීන් දෙපාර්ශවයන්ට පාලනය කර ගැනීමට නොහැකි හේතුන් නිසා කොන්ත්‍රාත් කාණ්ඩ අංක 01 සඳහා සේවයේ යොදවා සිටි විදේශ ජාතිකයින් බහුතරයක් රටින් පිටවීම නිසා කොන්ත්‍රාත් වැඩ නතර කිරීමට සිදු විය. කොන්ත්‍රාත් කාණ්ඩ අංක 01 ප්‍රගතිය ගණනය කිරීමේදී රට තුළට ගෙනෙන ලද වානේ කොටස් වල දළ අගය පමණක් ගණනය කර තිබූ අතර එම වානේ කොටස් එකලස් කිරීම වෙනුවෙන් වෙනස් රටවලදී සිදු කර තිබූ වියදම් භෞතික ගණනය කිරීමේදී සලකා නොතිබිණි.

**විගණනයේ නිර්දේශ**

සඳහන් කල හේතුන් කොන්ත්‍රාත් වැඩ සටහන මත සිදු වූ ප්‍රමාදය සැලකිල්ලට ගෙන නැවත වාර්ෂික වැඩ සටහන සංශෝධනය සිදුකර යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ප්‍රගති සමාලෝචනය කිරීම සිදු කල යුතුය.

**3.2 ඌන සම්පත් භාවිතය.**

* 2020 වර්ෂයෙහි ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මේ අරමුදල් සම්පාදන මූලාශ්‍රය අනුව රු.මිලියන 49,379.16 ක ප්‍රතිපාදන, ණය ලබා දෙන නියෝජිත ආයතන මගින් සලසා තිබූ අතර, ඉන් රු.මිලියන 29,317.11 එනම් සියයට 59කට සමාන ප්‍රමාණයක් 2019 දෙසැම්බර් 31 දින වන විට භාවිතා කර තිබූ අතර එම ප්‍රමාණය භාවිතා කිරීමට ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට වර්ෂ 06 ක කාලයක් ගත වී තිබුණි.
* මෙම ව්‍යාපෘතිය සඳහා වර්ෂය වෙනුවෙන් රජයේ දායකත්වය යටතේ රු.මිලියන 197 ක ශුද්ධ ප්‍රතිපාදන මුදලක් වෙන්කර දී තිබූ අතර, එම ප්‍රමාණයෙන් රු.මිලියන 164 ක මුදලක් එනම් සියයට 83 කට සමාන ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කර තිබුණි.

## 3.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු.

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකයාගේ නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීම වෙනුවෙන් හල්බරාව ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 34 ක මුදලක් වියදම් කර තිබූ අතර, ඇති වූ මහජන විරෝධතා නිසා 2015 ජුනි 17 දින ඉදිකිරීම නවතා දැමීමට සිදුවිය. පසුව මෙම පරිශ්‍රය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) වෙත භාර දී තිබුණි. | මේ සඳහා වැය වූ රු.මිලියන 34 ක මුදල අපතේ ගිය වියදමක් ලෙස සැලකේ. | පරිශ්‍රය තුළ වූ සියළුම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය වෙත ලබා දී ඇති අතර යම් ද්‍රව්‍ය ප්‍රමාණයන් මාර්ග සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් වැඩ සඳහා භාවිතා කර ඇත. වියදම් කළ මුදල අනාර්ථික වියදමක් සැලකිය නොහැක. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය මෙම ඉදිකර ඇති ගොඩනැගිලි කොටස් එහි ඉදිරි සංවර්ධන කටයුතු සඳහා භාවිතයට ගැනෙනු ඇත. | මෙම ශේෂය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ගැණුම්හි වෙනම කොටසක් ලෙස දැක්වීමටත් අවශ්‍යතාවය හා මාර්ග සංවර්ධන අධිකාරියට ව්‍යාපෘතියේ මාරු කරන ලද වත්කම් වටිනාකමින් ලියා හැරීම පියවර ගත යුතු බව. |